# දාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

36 වන කාණ්ඩය | 03 වන කලාපය | 2020 මැයි/ජුනි

# ඇඟළුම්මට කණකොකා හඬලයි



ශ්‍රී ලංකවේ පළමු කොරෝනා වෛරසය ආසාධිත රෝගියා හඳුනාගත්තේ 2020 මාර්තු 12 වැනිදාය. එය ක්‍රම ක්‍රමයෙන් රට තුළ ව්‍යාප්ත වන්නට වු අතර රජය විසින් ගත් තීරණ අනුව රට තුළ දිස්ත්‍රික්කය අනුව ඇඳිරිනීතිය දමා ගමනා ගමනය, කඩ සාප්පු වැසීම, පාසැල් වැසීම, රාජ්‍ය හා පෞද්ගලික අංශ තුළ සේවය කරන අයට නිවෙස් තුළ සිට වැඩ කිරීම යනාදී නීති රැසක් තුළ ජීවත් වීමට පසුගිය කාලයේ සිදු විය. මේ තුළින් පෞද්ගලික අංශයේ හා ස්වයං රැකියා තුළ නියළි සිටින සේවක සේවිකාවන්ට ජීවත් වීමට නිසි ආදායම් නොලද හෙයින්, ආර්ථික ප්‍රශ්ණ රාශියකට මුහුණ දීමට සිදුවිය.

මෙයින් ප්‍රධාන ලෙස රට තුළට විදේශ විනිමය ලබා දුන්, සංක්‍රමණික සේවය, ඇඟළුම්, තේ වතු, යන ක්ෂේත්‍ර හා අනිකුත් සුළු අපනයන භෝග වලිනි. ඒ නිසා අපනයන වැදගත් වන්නේ විදේශ විනිමය උපයා ගැනීමටය. නමුත් කොවිඩ් වසංගතය නිසා අපනයනය පහළ බැස ඇත.

මේ නිසා නිදහස් වෙළඳ කලාප තුළ සේවය කරන කම්කරුවන්ට කණ කොකා හැඬීමට පටන් ගෙන ඇත. ඔවුන්ගෙන් 90% පමණ නේවාසිකව සේවය කරන්නේ පිටිසර ගම් වලින් පැමිණ සිටින අය නිසා හා එක් කාමරයක කිහිප දෙනෙකු ලැගුම් ගෙන සිටින නිසාත් මීටර් ගණනින් ඈත්ව සිටීමටත්, සෞඛ්‍යයට හිතකර සිටින පරිසරයක ඔවුන් ජීවත්වෙන නිසාත් කොරෝනා තුළින් මිදී ජීවත් වීමට කිසිසේත් නොහැක.

වෙළඳ කලාප තුළ පිහිටුවා ඇති කර්මාන්තශාලා තුළින් වැඩි ප්‍රමාණයක් ඇඟළුම් වන අතර එහි නිෂ්පාදනයන් අපනයන කරති. සංවිධානය වීමට කිසිදු හැකියාවක් නොලබන ඔවුන් එකදිගට වසර 10-15 සේවය කළත් ඉතිරිකරගත් දෙයක් නැත. ඇත්තේ අර්ථසාධකය පමණි. එසේ ජීවත් වු ඔවුන්ට හිටි සැටියේ කර්මාන්තශාලා වැසීම තුළ බොහෝ දෙනෙකුට රැකියා අහිමි වී ඇත. ගමට ගොස් කිරීමට රැකියා නැත. බෝඩිමේ කුලිය ගෙවා ගැනීම නොහැකිව ඔවුන් එහි තුළ රැදී සිටින්නේ රැකියා නැවත ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි.

**ඇතුළු පිටු**

**03 පිටුව** - අවදානමට පෙර සුදානම් වෙමු
**04 පිටුව** - කොරෝනා හමුවේ ගැස්සුණු රැකියා
**05 පිටුව** - ඇයට එක් දිනක්...
**06 - 07 පිටුව** - අපේ වැඩ
**08 පිටුව** - සිතුවිල්ල/අපේ වැඩ ඉතිරි කොටස
**10 පිටුව** - කම්කරු දෙපාර්තමේන්තුව...
**11 පිටුව** - ප්‍රහේලිකාව / පබැඳුම

## ඩාබිඳු සාමුහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka


# ඇඟළුම් කර්මාන්තයට බරපතල ලෙස බලපෑ කොවිඩ් 19

රටේ ආර්ථිකයට විශාල වශයෙන් දායකත්වය සැපයූ ඇඟළුම් කර්මාන්තයේ නියැලී සිටි කම්කරුවන් ගෝලීය වසංගතයක් වූ කොවිඩ් 19 නිසා කබලින් ලිපට ඇද වැටී ඇත.

පසුගිය වසරේ නොවැම්බර් හා දෙසැම්බර් කාලපරිච්ඡේදයේ චීනය වෙලා ගන්නා මේ වසංගතය අද වන විට රටවල් 215 ව්‍යාප්ත වී ඇත මේ වන විට ලංකාවේ රෝගීන් ගණන 1800 ඉක්මවා සිටි. රෝගයෙන් වැළකීමට රටටම ඇඳිරිනීතිය බලපවත්වෙමින් සියළු දෙනා නිවාස වල රැදෙමින් උස්පහත් බේදයකින් තොරව වර්ණය, කුලය, ජාතිය, නොතකා වෛරසයේ බලපෑම පැතිර යන්නට විය. ජන ජීවිතය අඩාල වෙමින් ආර්ථික අර්බුදයක් මතු කරමින් සියළු ලෝක වාසීන් වෙත අතිවිශාල බලපෑමක් ඇති කරන ලදි. එක දිගට දින 70-80 ක් අප මේ අභියෝගය ජය ගැනීමට විවිධ ප්‍රශ්ණ හමුවේ. පොර බදන්නට සිදු විය.

මෙහිදි විශේෂයෙන් අවධානයට ලක් වුවන් අතර නිදහස් වෙළද කලාප සේවකයින් රට තුළ සංක්‍රමණයවී සේවය කරන නිසා අභියෝගය රැසකට මුහුණ දීමට සිදු විය. ආර්ථික බිඳ වැටීමට ඉඩනොදි අත්‍යාවශ්‍ය සේවාවන් ලෙස අපනයන ක්ෂේත්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාම අවැසි නිසා කම්කරුවන්ට ඉතාමත් අනාරක්ෂිත වටපිටාවක සේවය සැපයීමට සිදු විය. රටකට ඇඳිරිනීතිය පනවන අවස්ථාවේ රැකියාවේ නියැලීමට සිදු වු නිසා බහුතරයක් වු කම්කරුවන්ට සිය නේවාසිකාගාර තුළ සිර වීමට සිදු විය.

කෙසේ හෝ අවසානයේ නේවාසිකාගාර වල කටුක අත්දැකීම් ලබමින් නිරාහාරව ගත කරමින් සිටිය දී රජයේ මැදිහත් වීම මත කැමති පිරිසට ගම්බිම් වලට යාමට පහසුකම් සැලසිනි. නමුත් මෙහිදි මිනිස් බල ආයතන හරහා සේවය කරන පිරිස් හා අනෙකුත් හේතුන් මත ගම්බිම් වලට නොයන පිරිස් කළාපය තුළ රැදිනි. දෛනික වැටුපකට හිමිකම් කියන මැන්පවර් සේවය කරන සේවකයින් අදටත් ජීවනෝපාය සම්බන්ධව ගැටළු වලට මුහුණ පා සිටී.

කෙසේ හෝ වර්තමානයේ ඔවුන් මුහුණපාන ගැටළු වලට විසඳුම් සෙවීම රටක් ලෙස භාරදූර කටයුත්තක් වී ඇත. නැවත කර්මාන්තය අරඹා ඇති අතර මාර්තු අප්‍රේල් මාස වලට වැටුප් හිමි නොවු පිරිසක් ද වේ. මේ වනවිට මාස 6කට අඩු සේවා කාලයක් හිමි බොහෝ පිරිසකට රැකියාව අහිමි වී ඇත. සේවා කොන්දේසි කඩ වී ඇත.

අවම වැටුප මත ජීවිකා ගෙවන ඇඟළුම් කම්කරුවන් කිසිත් සමාජ සංරක්ෂණ වැඩ පිළිවෙලවල් වල පංගු කරුවන් නොවීමට ද ප්‍රදේශය තුළ ලියාපදිංචි නොවීම හේතු වී ඇත. වැටුප් කප්පාදුව, රැකියා අහිමි, රජයෙන් ලබා දෙන සහනාධාර වල ප්‍රතිලාභ භුක්ති විඳීමට ද අවස්ථාව අහිමිවී ගොස් ඇත.

විවිධ ගැටළු හා දුෂ්කරතාවන් මඟ හරවා ජන ජීවිතය යථා තත්වයට පත්කරගැනීම එකාවන්ව පෙරමුණ ගත යුතුය. දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් ද විසඳුම් සේවීමට කටයුතු කළ යුතුය.

බහුතරයක් වු කාන්තා ශ්‍රමික පිරිසක් සිටින ඇඟළුම් සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිත භාවය සම්බන්ධයෙන් මෙන්ම සමාජ සංරක්ෂණය මෙන්ම නැවත රැකියාව කිරීමේ දී සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු වන වැඩ පිළිබඳව සකස් කිරීම බලධාරීන්ගේ වගකීමයි. අභියෝග ජය ගැනීමට පෙළ ගැසෙමු.

# සමානාත්මතා ලෝකයක් කරා

මෙවර ජාත්‍යන්තර කාන්තා දිනයේ ගෝලීය තේමාව වුයේ සමානාත්මතා සමාජයක් තුළින් සක්‍රීය ලෝකයක් බිහි කිරීමයි. ලෝකයේ කාන්තාවෝ වීදි බැස එක හඩින් මෙදින අර්ථවත් කළේ සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික පසුබිම තුළ නිදහස, යුක්තිය හා සමානාත්මතාවය සුරක්ෂා කරගැනීම උදෙසාය.

නමුත් යතාර්ථවාදීව එම තත්ත්වයන් කාන්තාවන්ට ස්පර්ෂ කළ නොහැකි තරම් දුරක පවතින බැව් දිනෙන් දින අසන්නට දකින්නට ඇති සිදුවීම් වලින් පෙනෙනන්ට ඇත. නීති, ප්‍රඥප්තීන් කොපමණ ඇතත් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවීම නිසා ද කාත්තා අයිතීන් මානව අයිතීන් ලෙස පිළිනොගැනීම නිසාද බහුතරයක් වූ කාන්තාවන් යුක්තිය පසිදලීමේදී වෙනස්කොට සැළකීමට භාජනය වී ඇත.

අනෙක් අතට සංස්කෘතිය හා ආගම නිසාද කාන්තාවන්ගේ සමාජ ප්‍රගමනයන්ට බාධාවන් පමුනවා ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙන්ම විශ්ව විද්‍යාල, පරිපාලන ක්ෂේත්‍ර තුළද ඇය මූලිකත්වය ගෙන කටයුතු කළද පවුල් වගකීම් ඈ මත පැටවී ඇති නිසා ඉතාමත් කෙටි කාලයකින් සිය වෘත්තියෙන් බැහැර වී පවුලේ වගකීම් දරමින් ජීවත් වීමට සිදුව ඇත.

කාන්තාවන්ට ප්‍රජනන කාර්යයේ සිට නිෂ්පාදන කාර්යය හා සමාජ කාර්යන් කිරීමේ වගකීම පැවතියත් පුරුෂ මූලික සමාජ ක්‍රමය තුළ ඇය තවමත් සමාජ බලය අත්පත් කරගැනීමට අපොහොසත් වීම නිසා ඇය තීන්දු ගැනීමේ ක්‍රියාවලියෙන් බැහැර කර ඇත.

ප්‍රචණ්ඩත්වය, හිංසනය නිසා ඇය පවුලේ සිට සමාජය තලයේ දී වින්දිතයෙක් ලෙස පීඩනයන් යුතුව ජීවත් වේ. පසුගිය කාලවල කුඩා දැරිවියක් අපචාර ක්‍රියාවන්ට ලක්කර ගැනීමේ සිදුවීමේදී ඇයට සාධාරණය ඉටුකර ගැනීමට නොහැකි වී ඇත්තේ බලය මෙන්ම නීතියේ ආධිපත්‍යය ස්වාධීන නොවන නිසාය.

සියළු ක්ෂේත්‍ර වල කාන්තාවන් මේ දෘෂ්ඨිවාදය පැරදවීම සඳහා පෙළ ගැසිය යුතු අතර එදා කාන්තාවන් වීදි බැස දිනාගත් අයිතිය හා ජාත්‍යන්තර කාන්තා දිනය සැබෑ ලෙස භුක්ති විඳීමට හැකිවනුයේද එදිනටය.

එච්.අයි. සමන්මලී

# අවදානමට පෙර සූදානම් වෙමු

## වැඩ පරිසරයෙන් බැහැරව යාමේදීඅනුගමන කළ යුතු ක්‍රියාමාර්ග

පිටවීමට ප්‍රථම විෂබීජ හරණය.
පිටවීමට නියමිත දොරටු පමණක් භාවිතා කිරීම
අවම මීටරයක දුර පවත්වා ගැනීම

## නේවාසිකාගාර සහ ආපන ශාලාව භාවිතයේ දී ඔබ පිළිපැදිය යුතු කරුණු

ආපනශාලාව තුළ දී පොදු වේ පිඟන්, කෝප්ප, වීදුරු, ආහාර ආදිය භාවිතා නොකිරීම. තම කාණ්ඩායමට හෝ තමාට ආපන ශාලාව භාවිතා කිරීමට වේලාවක් වෙන් කර ඇත්නම්, එම වේලාව පමණක් ඒ සඳහා භාවිතා කිරීම.

පොදුවේ තුවා, අත්පිස්නා, ඇඳ ඇතිරිලි, ඇඳුම් ආදිය භාවිතා නොකිරීම.

නාන කාමර භාවිතයට පෙර සහ පසු සබන් දා අත් සේදීම.

## වැඩ පරිසරය තුළ දී ඔබ පිළිපැදිය යුතු කරුණු.

ඇඳුම් මාරු කිරීමේ කාමර සහ විවේක කාමර භාවිතයේ දී අවම මීටරයක දුර පවත්වා ගැනීම සහ තමන්ගේ නිළ ඇඳුම්, තම උපකරණ පමණක් භාවිතා කිරීම.

රාජකාරී කටයුතු වල යෙදීමේ දී දුරස්ථභාවය පවත්වා ගැනීමට අවශ්‍ය බිම් සළකුණු ලකුණු කර ඇත් නම්, නිසි පරිදි ඒවා අනුගමනය කිරීම.


තමාට නියමිත වැඩ පරිසරය තුළ පමණක් කටයුතු ඉටු කිරීම සහ ඇතුල් වීමට අවසර නොමැති ස්ථාන සඳහා ඇතුල් නොවීම.

## නිවසේ සිට වැඩ පරිසරය වෙත යාමේ දී ප්‍රවාහන මාධ්‍ය භාවිතය සහ වැඩ පරිසරයට ඇතුල් වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

හැකි සෑම විටම කෙටි දුරක් ඇත්නම්, පා ගමනින් හෝ යතුරු පැදියක් ප්‍රවාහන මාධ්‍ය ලෙස යොදා ගැනීම.

පොදු ප්‍රවාහන මාධ්‍ය භාවිතා කරන සෑම විටම මුඛ ආවරණ පැළඳීම සහ නිසි වාතාශ්‍රයක් ලැබෙන පරිදි අසුන් ගැනීම.

වැඩබිමට ඇතුල් වීමට ප්‍රථම සෞඛ්‍ය උපදෙස් අනුව විෂබීජ හරණය කර ගැනීම සහ ඇතුල් වීමට නියමිත දොරටු පමණක් භාවිතා කිරීම.






අන්තර්ජාලය ඇසුරෙන්

# කොරෝනා හමුවේ ගැස්සුනු රැකියා



මේ වන විට කලාප වල සේවකයින්ගේ රැකියා 25000 ක් පමණ අහිමි වී ඇත. ස්ථිර, අස්ථිර සේවකයින්ගේ රැකියා වැටුප් උන්හිටි තැන් අහිමිව අසරණ වී ඇත. බලධාරීන් නැසු කන්ව සිටී.

පසුගිය කාලයේ නේවාසිකාගාර තුළින් නැගුණු ඒ හඬ ප්‍රධාන ධාරාවේ අවධානයට ලක් නොවී රටේ ආර්ථිකයට මහත් පිටිවහලක් වූ කම්කරුවන් කුසට අහරක් නොමැතිව සෑම පැත්තකින්ම ගලාගෙන එන අභියෝග වලට මුහුණ දී ගත නොහැකිව අසරණ වී සිටි අයුරු අපට සියැසින් දැක ගැනීමට හැකි විය.

මේ මොහොතේ කළ හැකි කාරණයක් ලෙස වියළි සලාක බෙදමින් ඔවුන්ට සහයෝගයක් වීමට ඩාබිදු උත්සහ කළේ බෝඩිං වල සිටින තනිමව්රුන්ට, ගැබිණි මව්රුන්, මැන් පවර් සේවිකාවන්, තනිව ජීවත් වන අය, ගම්වල කාත් කව්රුත් නැති වයසක කාන්තාවන් මුලික කොටගෙනය.

වියළි සලාක බෙදන අතරතුරේ ඔවුන්ගේ දුක් ගැනවිල්ල මෙසේ සටහන් කිරීමට සිතුවේ පොළෝ තලයේ දුක ඔවුන්ගේ හද ගැහෙන රාවය රට පාලනය කරන උන්ගේ කන් වැසිමද සිදු විය යුතු බැවිනි.

## තෝරාගත් සංවේදී කථා කිහිපයක් අප මෙසේ එළ කරමු

මං මහෙලිකා, අපි 19 දෙනෙක් මේ නේවාසිකාගාරයේ ඉන්නවා ඉන් එක් කාමරයක පවුලක් ඉන්නවා 9 දෙනෙක් එක කාමරයක එක් අයෙකුට රුපියල් 2000 ක මුදලක් මාසිකව ගෙවලා ඔවුන් ඉන්නේ. අපි සියලු දෙනාම වැඩ කළේ මැන් පවර් හරහා අපි ඇවිත් ඉන්නේ පොළොන්නරුව, මඩකලපුව හා බදුල්ල වැනි ප්‍රදේශ වලින්, අපි හරිම අසරණ වුනා කන්න නැතුව අපිට කවුරුත් හිටියේ නෑ, අපි කොස් ඇට කාලා තේ කහට බීවා, සමහර දිනවල අපි දවසම නිදා ගත්තා, කන්න දෙයක් නැති නිසා, මෙහෙම ඉද්දී අපිට ඩාබිදු සංවිධානය ඇතුලු අනෙකුත් සංවිධාන උදව් කළා, අපිව මාස එකහමාරක් විතර බලාගන්නෙ ඒ සංවිධාන.

පසුගිය මාස කිහිපය තුළ අපට කිසිදු රැකියාවක් සොයා ගැනීමට නොහැකි වුනා. අපි බඩගින්නේ හිටපු වාර අනන්තයි. සබන් කැටයක් නැතුව අපි මාසයක් විතර නැවේ ඇඟ සේදුවේ. මේ ඉන්න අතරේ අපි සියළුදෙනා උත්සහ කළේ නැවත ගමට යන විදියක් හදා ගන්න. අපි පොලීසියට කීප වතාවක්ම ගියා. අවසානයේ අපට යන්න අවසර ලැබුනම බෝඩිමෙන් යන්න අවසර නැතිවුනා. බෝඩින් හිමිගේ කඩෙන් ණයට බඩුගත් නිසා හා බෝඩිං කුලී නොගෙව්ව නිසා. අපි යන්න සූදානම් වෙද්දී කිව්වා හිග මුදල් නැතිව යන්න දෙන්න බෑ කියලා. අපිට තර්ජනය කළා. පසුව අපි පොලීසියට පැමිණිලි කරලා බෝඩිං කුලිය අඩුකර ගත්තා. නමුත් අපි සියළුදෙනා ණයට ගත් බඩුවල මිළ ගෙවා ගන්න අපිට විදියක් තිබුනේ නැහැ. කොහොම හරි එකතු කරලා අපි රු.54000 ක මුදලෙන් රු.10000 ක මුදලක් ගෙවා දැමුවා. තව සහෝදරියක් ණය බේරුවේ ඇයගේ කණේ තිබුණු කරාබු දෙක දීලා. අවසානයේ අපි නිතරම උදව් කරපු සංවිධාන වලට දැනුම් දීලා ඔවුන් කිසිම පැකිලීමකින් තොරව එම මොහොතේම එම මුදල් බැංකුවට තැන්පත් කලාට පසුව අපිට ලැබුණු පාස් එනෙක් ගමට යන්න පුළුවන් වුණා.

## මේ තවත් අනුවේදනීය සිදුවීමකි...

දරු 3 දෙනෙකුගේ මවක් වන ඇයගේ 3 වැනි ගැහැණු දරුවාට මාසයකි. විවාහ වී සිටිනුයේ රියැදුරු සහයක කෙනෙකු සමගයි. ලොකු පුතාට අවුරුදු 4 ක් වන අතර දෙවැනි දුවට අවුරුදු 3කි . සැමියාට කොවිඩ් බලපෑම නිසා රැකියාව අහිමි වී ඇත. දරු තිදෙනා ජිවත් කිරීමේ අභිමුව හමුවේ ඇට මහත් වෙහෙසක් දරන්නට සිදුවිය. බෝඩිං කුලිය නොගෙවූ නිසා පොලීසියට ගියද පිළිසරණක් නොවූ තැන ඇඳිරිනීතිය තිබියදී බාල දරුවා හා ලොකු දරුවා සමඟ පාරට බැස්සේ බෝඩිං කුලියවත් සොයා ගැනීම සඳහායි.

## මැන් පවර් සේවිකාවක් වූ ඇගේ කථාවයි මේ...


මම කටුනායක එක්තරා ආයතනයක ස්ථිර සේවිකාවක් ලෙස සේවය කල අතර විවාහයෙන් පසුව රැකියාවෙන් ඉවත් වීමට සිදුවුනා. මගේ සැමියා බස්රථ රියැදුරෙක්. අපිට දරුවෝ 2ක් ඉන්නවා තුන්වෙනි දරුවා හම්බ වෙන්න තව මාස 4යි. මේ වන විට අපිට කිසිම ආදායමක් නෑ. අපි ගම්වලට යන්නේ නැතිව මෙහාට කොටු වෙලා හිටියේ. අපිට ගමේ කිසිම ආදායම් මාර්ගයක් නැති නිසයි. පසුගිය කාලයේ අපි දින කිහිපයක්ම කන්න නැතුව හිටියා. රජයෙන් ලබා දුන්න රු.5000 අපිට ලැබුනේ නැහැ. කිහිප වතාවක් ග්‍රාම නිළධාරී මුණ ගැසී අදාල පෝරම අද අපි පුරවා දුන්නත් අපිට කිසිදු ආධාරයක් ලැබුණේ නැහැ. නේවාසික කුලිය ගෙවා ගන්න බැරිව ඉන්නේ.

## දරුවා සමඟ තනිවූ තවත් දිරිය මවකගේ අනුවේදනීය කථාව...

මං මේ කලාපෙට ඇවිත් අවුරුදු 16ක් වෙනවා. මගේ ගම උලපනේ. මං මෙහිදී හිතවත් වූ කෙනෙකු සමඟ විවාහ වෙලා කාමරයක් අරන් ජීවත් වුනා අපිට දුවෙක් ඉන්නවා අද වෙනකොට අපේ ජීවිතේ ගොඩාක් දේවල් සිදුවුනා. එයා මීට පෙර විවාහ වූ කෙනෙක්. ඔහු මේ වෙනකොට ඔහුගේ පළමු විවාහයත් සමඟ මඩකලපුව ප්‍රදේශයේ ජීවත් වන බව තමයි ආරංචිය. මං දරුවටත් උගන්නගෙන රැකියාවත් කරගෙන ඉන්නවා. කොරෝනා උවදුර එක්ක අපි බොහොම අසරණ වුනා. කෑම අඩුපාඩු සිදුවුණා. අපිට කාත් කවුරුත් නෑ. කටුනායකට වෙලා දරුවත් හදාගෙන ඉන්න සිදුවෙලා තියෙනවා. මං අවුරුදු ගාණක් මේ ප්‍රදේශයේ ජීවත් වුවත් මට රු.5000 මුදල ලැබුණේ නෑ.

මෙවැනි අත්දැකීම් රාශියකට පසුගිය කාලයේ අප මුහුණ දුන් අතර මේ පිරිසගෙන් ලාභ ඉපැයූ පිරිස් අද ඔවුන්ව බැහැරකොට ඇත. යුද්ධයෙන්, සුනාමියෙන් මෙන්ම කොවිඩ් නිසාද බහුතරයක් වූ කාන්තාවන්ට පීඩා විඳීමට එවායේ ගොදුරු බවට පත්වීමට සිදුව ඇත. අද ලෝකයටම පාඩම් උගන්වා ඇති කොවිඩ් තුළින් නැගී සිටීමට නම් සියළු දෙනා එකාවන්ව අත්වැල් බැඳගත යුතුව ඇත.

# ඇයට එක් දිනක් නොවේ




අප මෙවර සැමරුවේ 2020 මාර්තු මස 8 වැනිදාට යෙදී ඇති ජාත්‍යන්තර ස්ත්‍රී දිනයයි. ශ්‍රී ලංකා වන අප රට බැරෑරුම් සමාජ, ආර්ථික දේශපාලන, ප්‍රචණ්ඩත්වය වැනි ප්‍රශ්ණ ගණනාවකට මුහුණ පා ඇත. සමස්ත වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය වෙන කවරදාටත් වැඩිය අනතුරකට ලක් වී ඇති යුගයක් අප පසු කරමින් සිටිමු. ජනතා පීඩනය, අයිතිවාසිකම් අහිමි කිරීමට එරෙහිව මතු වන ජනතා උද්ඝෝෂණ මර්ධනය කිරීමට අමතරව අධිකරණය නොමඟ යවමින් ඒවා වැලැක්වීමේ නියෝග ලබා ගැනීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදය අවභාවිතාවේ යොදවමින් පවතී. අනික් පැත්තෙන් ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වර්ධනය වී ඇත. ස්ත්‍රී දූෂණ, ළමා අපචාර වල ප්‍රවණතාවයක් දක්නට ඇත. ජීවන බර ඉහල යාම තුළ ස්ත්‍රීන්ට ඉසලිය නොහැකි පවුල් බරක් දරන්නට සිදු ව ඇත.

ගොවි, වතු, ධීවර ක්ෂේත්‍ර හා නිදහස් වෙළඳ කලාප තුළ සේවය කරන කම්කරු ස්ත්‍රීන්ට ශ්‍රමයට සරිලන වැටුපක් නොලැබීම, පහත්කොට සැලකීම, ගෞරවයක් නොලැබීම යනා දී ප්‍රශ්ණ ගණනාවත් මේ වන විට විසඳී නැත. වර්තමානය වන විටත් නන් දෙසින් ඇසෙන්නේ ස්ත්‍රීන්ට සිදු වන ප්‍රචණ්ඩත්වයයි. මේ සියලුම දේ සිදුවන්නේ කාන්තාව පිළිබඳ ගෞරවය අප සමාජය තුළින් ගිලිහි ගොස් ඇති නිසයි.

මැක්සිම් ගොර්කි පවසන පරිදි ලෝකය නිර්මාණය වී ඇත්තේ හිරුගේ රැස් වලින් හා මවගේ කිරි වලිනි. එවැනි වූ අසීමිත ශක්තියක් ඇති ඇය බිහිකල ජීවියා ශක්ති සම්පන්න කළ හැක්කේ කාන්තාවකට මිස පිරිමියාට නොවේ. මාස නවයක් පුරා සිය සිරුර තුළ මිනිස් ජීවියෙකු තබා ගනිමින් අපමණ දුක් කම්කටොළු විඳිමින් කරන ඒ අප්‍රමාණ කැප කිරීම ගැන අප කතා කළ යුතුයි. ඉවසීම, දරාගැනීම, ශක්තිය, කැපවීම, ආදරය, කරුණාව, දයාව, සෙනෙහස ඈදි උත්තරීත්තර වස්තුව වන්නේද කාන්තාවයි. ඇගේ ආදරය මිනිසුන්ගේ ජීවය රැකදෙන මාහැඟි දිය දහරක් සේ සමානය. එවැනි කාන්තාව සුරක්ෂිත කිරීම අද දවසේ අත්‍යවශයෙන්ම සිදු විය යුතු දෙයකි.

වර්තමානයේ නේක දෙසින් ඇසෙන්නේ පීඩා කිරීම් ගැනය. අපචාරයන්ය එසේ නැත්තම් දූෂණය කර මරා දැමීමය. ඇගේ ගෞරවය කෙලෙසා දැමීමය. මේ සියලු දෙයින් සිදු වන්නේ කාන්තාවන්ගේ ගෞරවය අප සමාජයේ ගිලිහී ගොස් ඇති නිසාය. එමෙන්ම පවුලේ ආර්ථික ගොඩ නගා ගැනීම සඳහා මැදපෙරදිග රටවල් වල ගෘහ සේවයට යන කාන්තාවන් බොහෝ විට හිරිහැර විඳින්නට සිදු වේ. ඔවුන් කරන රැකියාවේද ගරුත්වයක් නොලබන්නේය. විදෙස්ගත වන කාන්තාවට මෙරට ඡන්ද අයිතිය ද අහිමි වේ.

අපේ පියවරුන් විසින් උපයන මුදල් නිසි කළමණාකාතිත්වයකින් යුතුව ඇය කටයුතු කරන්නේ පවුලේ සියලු බර දරා ගෙනය. එපමණක් නොව දළ ජාතික නිශ්පාදනයට 62% දායකත්වය කාන්තාවන්ගෙන්ය. ජනග්‍රහණයෙන් 52% ක් කාන්තාවන්ය. මෙවන් තත්වයක් තුළ රටේ උන්නතිය උදේසා ඔවුන්ගේ දායකත්වය කොපමණ දැයි වටහා ගත යුතුයි.

එබැවින් ඇය ලොවට සම්පතක් එම සම්පත රැක ගැනීම සමාජයේ සතු වගකීමකි. ඒ පිළිබද සිහි කරමින් වසරකට වරක් ජාත්‍යන්තර කාන්තා දිනය සමරන්නේ වැළලී යන කාන්තා අයිතීන් හා සුරක්ෂිතභාවය රැක ගැනීමටය. අප සියලු දෙනාගේ දායකත්වය ඇයට ලබා දිය යුතුයි.

පෙර මෙන් නොව මේ වන විට මත්ද්‍රව්‍ය රකුසා විසින් තරුණ ජීවිත බිලිගෙන ඇත. කිලෝ ගණන් රට තුළට ගෙන්වන්නේ අත්‍යවශ්‍ය ආහාර ලෙසටය. මෙයට ඇබ්බැයි වුනු තරුණයන් බාල අපරාධ කිරීමට ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම් වලට පෙළඹීම තුල රටේ තත්වය පහත් මට්ටමකට දමා ඇත. ධන බලය නිල බලය තුළ නීතිය අවනීතිය වී ඇත. මේ තුළින්ද සිදු වන ක්‍රියාවන් නිසා දරුවන් රැකබලා ගැනීමේ වගකීම ස්ත්‍රීන්ට බලපා ඇති තවත් ප්‍රශ්ණයකි.

**එච්. අයි.සමන්මලී**

# ජාත්‍යන්තර කාන්තා දින සැමරුම කිලිනොච්චියේ දී

ඩාබිඳු සාමුහිකය විසින් මෙවර ජාත්‍යන්තර කාන්තා දිනය 08/03/2020 දින කිලිනොච්චියේදී උත්කර්ශවත් අයුරින් සමරන ලදි.

ඩාබිඳු සාමූහිකයට සම්බන්ධ කිලිනොච්චිය හා වව්නියාව ප්‍රදේශයේ කම්කරු කාන්තාවන් හා සිවිල් සමාජ සංවිධාන වල සහභාගිත්වයෙන් පැවති මෙම වැඩ සටහන කිලිනොච්චියේ පිහිටි සමූපකාර මධ්‍යස්ථානයේදී පවත්වනු ලැබිණි.

මෙහි ප්‍රධාන දේශණය පැවැත්වීම සඳහා යාපනය දිස්ත්‍රික්කයේ කාන්තා සංවර්ධන නිළධාරිනී උදයනී නවරත්නම් මහත්මිය සම්බන්ධ විය. එසේම වව්නියාව ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය නිළධාරිනී දෙදෙනෙකුද කිලිනොච්චිය පොලීසියේ ළමා හා කාන්තා කාර්යංශයේ කාන්තා නිළධාරිනීන් දෙදෙනෙකු මෙන්ම සිවිල් සංවිධාන නියෝජනය කරමින් වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා දායක විය.

කිලිනොච්චිය ඩිපෝ මංසන්දියේ සිට පෙළපාලියකින් පැමිණි පිරිස කම්කරු අයිතීන් මෙන්ම කාන්තා අයිතීන් තහවුරු කරන මෙන් ඉල්ලා උද්ඝෝෂණයේ නිරත විය.






ඉන් අනතුරුව පැමිණ සිටි සියළුදෙනා පිළිගනිමින් පොල්තෙල් පහන් දල්වා පිළිගැනීමේ නැටුමක්ද ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඩාබිඳු සාමූහිකයේ කිලිනොච්චි දිස්ත්‍රික් සම්බන්ධිකාරිණී අයිගරන් ශ්‍රීකාන්ති මහත්මිය විසින් සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව ඩාබිඳු වැඩසටහන් සම්බන්ධීකාරිණී චමිලා තුෂාරි මහත්මිය විසින් ජාත්‍යන්තර කාන්තා දිනයේ වැදගත්කම හා වර්තමාන කාන්තාව පවුලතුළ රැකියාව තුළ හා සමාජය තුළ අත්විදින තත්වයන් පිළිබඳ අත්දැකීම් සභාවට ඉදිරිපත් කරන ලදි. වසර 30 යුද වාතාවරණයට සමගාමීව අතුරුදහන් වූ තම සමීපතමයන්ට යුක්තිය සාධාරණත්වය ඉටුකර ගැනීම සඳහා මහපාරේ සිට උද්ඝෝෂණය කිරීමට තවමත් සිදු වී ඇති බවද, තේ වතු, කාන්තාව, සංක්‍රමණික කාන්තාව හා ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තාවන් රටට සපයන දායකත්වයට සාපේක්ෂව ඔවුන්ට හිමි ගරුත්වය හා ශ්‍රමයට වටිනාකමක් ලබා ගැනීම උදෙසා කොපමණ නීති සකසා තිබුණත් අරගල කරමින් ඒවා දිනා ගැනීමට සිදුව ඇති බව සඳහන් කරන ලදි. නීතිපොත් වල, සම්මුතීන් වල කාන්තා අයිතීන්

8 වන පිටුවට...

# NUSS හී ජාත්‍යන්තර කාන්තා දින සැමරුම සිවිල් සංවිධාන හා වෘත්තීය සමිති එකමුතුවෙන්

මෙවර 103 වැනි ජාත්‍යන්තර කාන්තා දිනය නිමිති කොටගෙන රට පුරා විවිධ වැඩසටහන් පැවැත්විණි. ඒ අතරින් පසුගිය මාර්තු 11 වැනිදා සිවිල් සංවිධාන හා වෘත්තීය සමිති එකමුතුවෙන් ශ්‍රි ලංකා නාවිකයන්ගේ සංගමය විසින් කාන්තා දිනය නිමිති කොට ගෙන සැමරුම් උත්සවයක් කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පැවැතිවිණි. ඒ සඳහා විවිධ අංශයන්හී වෘත්තීය සමිති ඔවුන්ගේ සහයෝගය ලබා දුනි. ඩාබිඳු සාමුහිකය විසින් එයට සහයෝගය දක්වමින් කිලිනොච්චි හා වව්නියා ප්‍රදේශවල ඇඟලුම් කර්මාන්තශාලාවන් හී සේවය කරන ඩාබිඳු සාමුහිකයේ සාමාජිකයන් පිරිසක් ද සහභාගි විය. එහිදී අප සාමාජිකාවක් විසින් උතුරු ප්‍රදේශයේ යුද්ධයෙන් පසුව කර්මාන්තශලා බිහිවීමත් සමග ඇඟළුම් ක්ෂේත්‍රයේ අත්දැකීම් සභාවට ඉදිරිපත් කරන ලදි.

# ජාත්‍යන්තර වෘත්තීය සමිති හමුව ශ්‍රී ලංකාවේ දී

ජර්මනියේ කම්කරු වෘත්තීය සමිතියක් වන Free Workers Union සංවිධානයේ යෝජනාව පරිදි ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තර වෘත්තිය සමිතිවල හමුවක් පසුගිය පෙබරවාරි මස 21 හා 22 යන දිනයන් හීදී කොල්ලුපිටියේ පිහිටි ලංකා වෙළඳ, කාර්මික සහා පොදු කම්කරු සංගමයේ දී පැවැත්විණි. ඒ සඳහා ජාත්‍යන්තරය නියෝජනය කරමින් විදෙස් රටවල් හතරකින් නියෝජිතයින් නව දෙනෙකු හා ජර්මනියෙන් එක් මාධ්‍යවේදීනියක් සහභාගී විය. එම වෘත්තිය සමිති නම් ජර්මනියේ FAU වෘත්තිය සමිතියත්, ස්පාඤ්ඤය නියෝජනය කරමින් ICL හා CNT සංවිධානයත්, මියන්මාරය නියෝජනය කරමින් Solidarity Center හා Action Labor Right වෘත්තිය සමිතියත් බංගලාදේශය නියෝජනය කරමින් Garment Workers Trade Union Center සංවිධානය මෙම අවස්ථාවට සහාගී විය. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඩාබිඳු සාමූහිකය, ශ්‍රමාභිමාණි කේන්ද්‍රය, NUSS, CMU, වාණිජ හා වෙළඳ සේවක සංගමය, මෙම ජාත්‍යන්තර වෘත්තිය සමිති හමුවට සහභාගී විය. ඩාබිඳු සාමූහිකය මෙහි සත්කාරක දායකත්වය සපයන ලදි. දින දෙකක් පැවතුණු මෙම සාකච්ඡාවේ දී ජාත්‍යන්තර වශයෙන් වෘත්තිය සමිති අතර පුළුල් සම්බන්ධතාවත් ගොඩනගා ගන්නා ආකාරය පිළිබඳ සාකච්ඡා විය.




# බහුපාර්ශවිය සාකච්ඡා හමුවක් වව්නියාවේ දී හා කිලිනොච්චි හි දී




කම්කරු ගැටලු ආමන්ත්‍රණය තනි තනිව සිදු කරනවාට වඩා සාමූහිකව ක්‍රියාකරිත්වයේ වැදගත්කම ඩාබිඳු සාමූහිකය ලෙස වසර 35 ක අත්දැකීම් මත අප අවබෝධ කරගෙන ඇති හෙයින් මෙම ගැටලු ආමන්ත්‍රණය කිරීම සඳහා විවිධ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම හරහා ගැටලු විවිධ දෘෂ්ටි කෝණයෙන් විමසා බැලීමට සහ වඩාත් ප්‍රයෝගික පිළිතුරු සැපයිමට හැකි බව අපගේ විශ්වාසයයි.

උතුරු ප්‍රදේශයේ ඇඟලුම් ක්ෂෙත්‍රයේ පවතින ගැටලු ආමන්ත්‍රණය කිරීමේ ක්‍රමවේදයක් ලෙස ඩාබිඳු සාමූහිකය විසින් පවත්වාගෙන යනු ලබන බහු පාර්ශවිය සාකච්ඡා මාලාවේ තවත් එක් අදියරක් පසුගිය පෙබරවාරි 5 වැනිදා වව්නියා නෙල්ලි ස්ටාර් උත්සව ශාලාවේ දී පැවැත්විණි, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම, කම්කරු දෙපාර්තමේන්තුව, පොලිසිය කාන්තා කාර්යංශය හා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය හා ප්‍රදේශයේ සිවිල් සංවිධාන එදින සහාගි විය. මෙම සාකච්ඡාව ඉතාමත් සාර්ථක සාකච්ඡාවක් විය.

එදින සාකච්ඡාවන්ගෙන් ඉදිරි යෝජනා වශයෙන් කම්කරුවන්ගේ පැමිණිලි පොලිසිය වෙත වාර්තා වන ලෙස කඩිනම් යාන්ත්‍රණයක් සකස් කිරීම, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි තුමා විසින් ආයතන වෙත ගොස් තොරතුරු සොයා බලා ක්‍රියාත්මක වීම, කම්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, සිවිල් සංවිධාන සමග මේ පිළිබඳ දිගින් දිගටම සාකච්ඡා කරමින් පාර්ශව කරුවන්ගේ සම්බන්ධතා ගොඩනැගීම පිළිබඳ ඔවුන්ගේ එකඟතාවය පළ විය.

එම හමුවේ දෙවැනි සාකච්ඡාව පෙබරවාරි මස 22 දින කිලිනොච්චි හි සමුපාකාර මණ්ඩල ශාලාවේ දී පැවැත්විණි. එයට කිලිනොච්චි පොලිස් කාන්තා කාර්යංශය නිළධාරින්, පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණිය, මානව හිමිකම් කොමිෂන් සභාවේ නිළධාරින්, කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ප්‍රදේශයේ සිවිල් සංවිධාන සහාගි විය. 2019 වසරේන් පසුව පැවැත් වූ තෙවැනි පාර්ශව කරුවන්ගේ සාකච්ඡා මාලාව මෙවරත් ඉතා හරවත් අයුරින් පුළුල් ලෙස දියත් විය. ඩාබිඳු සාමූහිකයේ චමිලා තුෂාරි මහත්මිය විසින් කම්කරුවන්ගේ ගැටලු සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සාකච්ඡාවේ අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට සභාවට අවස්ථාව හිමි විය. එහිදී ප්‍රදේශය නියෝජනය කරමින් පැමිණි කාන්තා සංවිධාන විසින් කම්කරු කාන්තාවන් මුහුණ පාන ගැටළු මනා ලෙස ගොනු කරමින් සභාවට ඉදිරිපත් කළ අතර කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීමට සියළු දෙනා සහයෝගයෙන් වැඩකටයුතු කළ යුතු බවට යෝජනා විය. එදින සාකච්ඡාවට ලක්කළ කරුණු සම්බන්ධව පැමිණි සිටි නිළධාරීන් විසින් සොයා බැලීමට එකඟ වූ අතර මාස 3 වරක් එසේ රැස්වී ඒකාබද්ධ වැඩපිළිවෙලක් දියත් කිරීම සුදුසු බවද තීරණය විය.

# සිතුවිල්ල

ඒයි සුමී, මොකද බං ඔලුවේ ඉදන් රෙද්දක් පොරොවගෙන නිදි. අසනීපයක් වත් ද? දැන් 8 ත් පහු වෙලා. මොනවට ඇහැරගෙන ඉන්නද අනේ. වෙනදා වගේ වැඩට දුවන්න, පාන්දර නැගිටින්න ඕනේ නැහැනේ. උදෙන්ම වැඩට දුවනවා හතිදාගෙන. එහි ගොස් යකඩ මැෂිමත් සමඟ පොර බදිනවා කලුවර වැටීගෙන එනකොට කම්හලෙන් එළියට බහිනවා. අවට තියෙන කඩෙන් පාන් භාගයක්, වඩේ එකක් හරි රොටියක් හරි අරන් බෝඩිමට ඇවිත් ගිලලා, මදුරු සිංදු අහන් නිදියනවා. කොරෝනා ආව නිසා දැන් එහෙම දුවන්න ඕනේ නෑ. සපාන් එකේ නිදියන්න පුළුවන්නේ.

උඹට ඉතින් පවුල් බරක් තියෙනවැයි. මට වගේ මම නම් මේ කොරෝනා නිසා කොරවෙලා ඉන්නේ බෝඩිමට කොටු වෙලා, නෝ පේ, නෝ ඕටී, නෝ බෝනස්. මදැයි අවුරුදු කන්න ගමේ යන්න සිටියා. පිස්සුද උඹට ගමේ යන්න තියා බෝඩිමෙන් එළියට අඩිය තියන්න බෑ. මීටරේ දුරින් ඉන්න ඕනේ. ඔය කියන විදියට මීටරේ දුරින් ඉන්න ගියොත් බෝඩිමේ එළියේ තමයි මට නිදාගන්න වෙන්නේ. අපේ කාමරය හතර දෙනෙක් ඉන්නවානේ. උයන්න, නාන්න, කන්න, නිදියන්න වෙන්නේ එකටනේ. ලෙඩා මලත් බඩ සුද්දයි කිවාලු. සෞඛ්‍ය පැත්තනම් අන්තිමයි.

ඒකනම් ඇත්ත තමයි, හොඳ වේලාවට විවිධ සංවිධාන වලින් ඇවිත් අපට බඩු පාර්සල් බෙදුවේ. ඒකනම් ලොකු දෙයක් ඒවාගෙන් ජාමේ බේර ගත්ත නිසා බඩගෝස්තරේ පුරවා ගත්තා. ඔහොමවත් නොලැබුනාම් අපි කපෝතියි. අපි ගැන ලියන අයට නම් හොඳ වාර්තා තියෙනවා. කලාප තුළ සේවය කරන කම්කරු ස්ත්‍රීන්ට මන්දපෝෂණය වැඩි වෙලා, ලේ අඩු වෙලා, රක්තහීනතාවයෙන් පෙළෙනවා. අඩුබර දරු උපත්. අනේ බොල දැන් කොරෝනාවක් එකතු වෙයිද මන්ද ඒ මදිවට රැකියා නැතිව යන ප්‍රශ්ණ. මඟුලක් කර ගන්නවත් බෑ. වයස ප්‍රශ්ණ එහෙන්. ගෙදරම නිරෝධානය වෙන්න වෙයිද මන්දා ගෙදර ගියොත් අඹු නසී. මඟ ලැග්ගොත් තෝ නසී.

අනේ ඔය කන්කරච්චලේ නතර කර ගන්න. මේ දවස්වල තමයි ටිකක් නිදහසේ නිදිය ගන්න තියෙන්නේ. රජය විසින් ගත් දැඩි නීති රීති හා සෞඛ්‍ය ආරක්ෂාව දැඩිලෙස ක්‍රියාත්මක වුණු නිසා තමයි අපි කොර වෙන්නේ නැතුව බේරුණේ.

බලන්න, නීති, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය ගැන තදින් කථා කළාට ජනතාවට සලකන හැටි පේනවා නේද?

සමන්තා

## 6 පිටුවෙන්... ජාත්‍යන්තර කාන්තා දින...

පිළිබඳ කොතෙකුත් සඳහන් කොට ඇතත් සමාජ මතිමතාන්තර හා ගතානුගතිකත්වයන් නිසා ඒවා සැබෑ ලෙස භුක්ති විඳීමේ අයිතිය අහෝසි කොට ඇත. ආගම සංස්කෘතිය තුළ මිත්‍යා මත හා ගෝත්‍රිකවාදී මත සමාජගත කිරීම තුළ තවදුරටත් ඇය සිරකොට දමා ඇති බවද පවසමින් හරයාත්මක සමානත්මතාවන් භුක්ති විඳීමටනම් ගෝලීය ධනවාදය මෙන්ම කාර්මීකරණයට සාපේක්ෂව කාන්තාවගේ භූමිකාව පිළිගත යුතු බවද ඇය අවසාන වශයෙන් ප්‍රකාශ කරන ලදි.

ඉන් අනතුරුව ප්‍රධාන දේශනාව සඳහා පැමිණි උදයනී නවරත්නම් මහත්මිය ඇයගේ කථාව ඉදිරිපත් කරමින් පවසා සිටියේ අයිතීන් දිනා ගැනීම සඳහා අප කාන්තාවන් ලෙස ඒකරාශී විය යුතු බවයි. කාලාපීය වශයෙන් අප 1995 වසරේදී බීජිං වේදිකාව හරහා ක්ෂේත්‍ර 12ක් ආවරණය වන පරිදී කාන්තා අයිතීන් ශක්තිමත් කිරීම සඳහා ඒකරාශි වී සිටින බවද, ප්‍රධාන ක්ෂේත්‍ර 3න හරහා කාන්තාවන් 80% ක පමණ අපනයන ආදායමක් මෙරටට එක්කරන බවද ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තාවන් තමන්ගේ වෘත්තීයේදී මූලික කම්කරු අයිතීන් තහවුරු කරගැනීමට අවස්ථාව අහිමි වී තිබෙන බවද වැඩිදුරටත් සඳහන් කරමින් පවසන ලදි. එසේම සමාජ අවමානය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, තනි මව්වරුන් වීම, මත් ද්‍රව්‍ය භාවිතය, ගෘහ මූලික කාන්තාවන් බවට පත්වීම, ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා දිවි නසා ගැනීම, දැවැදි ප්‍රශ්ණ වැනි බොහෝ තාඩන පීඩන මැද්දේ කාන්තාවන්ට දිවි ගෙවීමට සිදුවී ඇති බව ඇය විසින් ප්‍රකාශ කරන ලදි. ඇය සේවයට ගියත් ගෙදර ප්‍රශ්ණ පිළිබඳ තැවෙමින් ජීවත් වීමට සිදුවන බවද නිවසට ආවත් ආයතනයේ බලපෑම පිළිබද සිතමින් ජීවත් වීමට සිදුවී ඇති බවද තවදුරටත් සඳහන් කරමින් ඇය පවසා සිටියාය

රජ්‍ය මේ පිළබඳව අවධානය යොමුකළ යුතු වුවත් කාන්තාවන් නිරන්තරයෙන් ප්‍රචණ්ඩත්වයට, හිංසනයට ලක්වන බැවින් මේ සඳහා සියළු දෙනා ඒකරාශී වි අයිතීන් දිනා ගැනීම සඳහා පෙළ ගැසිය යුතු බව අවසාන වශයෙන් ඩාබිඳු වැනි සංවිධාන සමඟ ඒකාබද්ධ වී වැඩකළයුතු බවද සඳහන් කරන ලදි.

ඉන් අනතුරුව ඩාබිඳු සාමාජිකයින් විසින් නිර්මාණය කළ නාට්‍යයක් සභාවට ඉදිරිපත් කෙරුණු අතර එයින් කාන්තාවන් සිය නිවෙස, සමාජය හා සේවස්ථානයේදී ප්‍රචණ්ඩත්වයට හා හිංසනයට ලක්වන අයුරු මනාව පෙන්නුම් කරන ලදි.

කිලිනොච්චිය ප්‍රදේශයේ පොලිසිය නියෝජනය කරමින් ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථාන භාර නිළධාරිනිමිය විසින් කාන්තවන් ලෙස ලක්වන පීඩනයන් හා පොලිස් පැමිණිළි උදාහරණයට ගනිමින් ප්‍රදේශය තුළ කාන්තාවන් මුහුණපාන ගැටළු පිළිබඳව සභාවට ඉදිරිපත් කරන ලදි. පැමිණිළි කිරීම තුළින් පමණයි වරද කරුවන්ට දඬුවම් දිය හැක්කේ ඒ නිසා ඒවා සමාජ ගත කරමින් වරද කරුවන් හෙළදරව් කිරිමෙන් ඒවාට උදව් වීමට සියළු දෙනා වගබලා ගතයුතු බවද අවධාරණය කරන ලදි.

එසේම වව්නියාව ප්‍රදේශය නියෝජනය කරමින් පැමිණි පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිමියද කාන්තාවන්ට බලපාන සෞඛ්‍යය ගැටළු සම්බන්ධව හා පවුල් සැළසුම් ක්‍රම පිළිබදව ද ගෘහ මූලික කාන්තාවන් වීම නිසා හා ළමා මව්වරුන් වීම නිසාද තනි මව්වරුන් වීම නිසාද මුහුණ පාන ගැටළු සම්බන්ධයෙන් සිය අත්දැකීම් අනුසාරයෙන් වැදගත් කරුණු සභාවට ඉදිරිපත් කරන ලදි.

එසේම ඩාබිඳු සාමාජිකාවන් හා ඔවුන්ගේ දරුවන් විසින් නැටුම් ගැයුම් වලින් සභාව ඔපවත් කරන ලදි.

# ස්ත්‍රී /පුරුෂ සමාජභාවීය ගැටලු ආමන්ත්‍රණය කිරීමේ මණ්ඩප හමුව කම්කරු දෙපාර්තමේන්තුවේ දී

නිදහස් වෙළඳ කලාප කම්කරු කාන්තාවන් මුහුණ පාන ගැටලු බහුපාර්ශවික සාකච්ඡා මාලාවන් හරහා ආමන්ත්‍රණය කිරීමේ ප්‍රයත්නයක් 2016 වසරේ සිට ඩාබිඳු වශයෙන් අපි දියත් කළෙමු. තවද 2017 වසරෙන් පසුව අනතුරුව ආයෝජනය මණ්ඩලය මෙම සාකච්ඡා ලබා දීම දිනෙන් දින කල් දැමීම නිරන්තරයෙන් සිදුවිය. එසේම නිදහස් වෙළඳ කලාප වල පවතින මෙම ගැටලු දිනෙන් දින උග්‍ර වෙමින් පවතී. එම නිසා කඩිනමින් පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් මෙම සාකච්ඡා මණ්ඩපයන් ගොඩ නැගීමට ඩාබිඳු විසින් ඉදිරිපත් කරනු



ලැබූ ලිපියට පිළිතුරු වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පසුගිය මාර්තු මස 04 වැනි දින කම්කරු දෙපාර්තමේන්තුවේ දී සාකච්ඡාවට අවස්ථාව ලැබිණි.

පළමුව ඩාබිඳු සාමූහිකය විසින් කම්කරුවන් සමග පවත්වනු ලැබූ නේවාසිකාගාර සාකච්ඡාවන් හරහා මතු කරගත් ගැටලු සභාවට ඉදිරිපත් කිරීම සිදු විය. ඒ වගේම බියගම කලාප වල පවතින ගැටලු නිම්භාණ්ඩ හා ඇඟලුම් සේවක සංගමයේ නියෝජිතයින් විසින් ඉදිරිපත් කිරීම සිදු විය. තවදුරටත් අදහස් දක්වමින් ශ්‍රමාභිමාණී කේන්ද්‍රය විසින් පවසා සිටියේ දමිළ කම්කරුවන්ට පවතින ගැටලු වලට විසඳුම් ලබා ගැනීම අපහසු කාර්යයක් බවයි. එහිදි පසුගිය වසරේ පවත්වනු ලැබූ සාකච්ඡාවන් වලදි මතු කරගත් ගැටලු ඇතුළත් වාර්තාවක් කම්කරු දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා කොමසාරිස්තුමිය වෙත ඉදිරිපත් කරනු ලැබිණි. එම වාර්තාවට අනුව අප විසින් ඉදිරිපත් කළ ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින් ඉදිරියේ දී මෙම වාර්තාවට අදාළ අනිකුත් පාර්ශවකරුවන් සමග එක්ව පුළුල්ව සාකච්ඡා කිරීමට එකඟ විය.

# ඇඟළුම් කම්කරුවන් වෙත වියළි ආහාර බෙදා දීම

කොවිඩ් වසංගතයේ බලපෑමෙන් වැඩි වශයෙන් අසරණ වුයේ සංක්‍රමණිකව සේවය කරන ඇඟලුම් කම්කරුවන්ය. රැකියාව වෙනුවෙන් නිදහස් වෙළඳ කළාපයන් වලට පැමිණ නේවාසිකාගාර වල රැඳී සිටි ඔවුන්ට හිටි හැටියේම මුහුණ දීමට සිදු වු මෙම වසංගත තත්වයේ දී ඔවුන් වෙනුවෙන් රජයේ මැදිහත් විමක් දක්නට නොලැබිණි.

රජය විසින් ලබා දුන් කිසිදු ආධාර මුදලකට හෝ වියළි සලාකයන් මොවුන්ට හිමි නොවිණි. එම නිසා ඩාබිඳු සාමුහිකයේ මැදිහත් වීම ඇඳිරිනීතිය ආරම්භයේ සිටම සිදු කෙරිණි. දිර්ඝව පැනවු ඇඳිරිනීති තත්වයේ දී ආහාර නොමැතිව දින ගණනක් නේවාසිකාගාර වල කම්කරුවන් සිර වී සිටියේය. භාණ්ඩ මිලදී ගැනීමට ඇඳිරිනීතිය ලිහිල් කරන අවස්ථාවන් වල දිනකට අවශ්‍ය ආහර ද්‍රව්‍ය මිලදී ගැනීමේ හැකියාවක් වත් ඔවුන් නැත. එයට හේතුව ප්‍රමාණය ඉක්මවා වෙළඳසැල් වලින් ණයට භාණ්ඩ මිලදී ගැනීම හා වැටුප් නොලැබිම නිසාවෙනි. එම නිසා ඩාබිඳු මැදිහත් වීම හරහා විවිධ සංවිධාන හා එක්ව වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීම සිදු කෙරිණි. එයට දායකත්වය සපයමින් නීලන් තෙරුවෙල්වම් භාරය විසින් අවශ්‍ය ආහාර ද්‍රව්‍ය



මලූ 250 ක් කටුනායක හා බියගම කම්කරු කාන්තාවන් වෙත ලබා දෙන ලදී. කටුනායක වගේම උතුරු ප්‍රදේශයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අසරණ වු කම්කරු කාන්තාවන් 75 දෙනෙකු වෙනුවෙන් වියළි ආහාර ද්‍රව්‍ය සඳහා මුල්‍යාධාර සර්වෝදය සංවිධානය විසින් අප වෙත ලබා දෙන ලදි. ඒ වගේම මුහුදු නාවිකයින්ගේ සංගමය විසින් වියළි ආහාර මලූ 50 ද ලංකා බැංකු සේවක සංගමයේ අනුග්‍රහයෙන් වියළි ආහාර ද්‍රව්‍ය මලූ 250 ක් ද කලාපයේ සේවය කරන ගැබිණි මව්වරුන් හා කාන්තාවන් හා මැන් පවර් සේවකයින් අතර බෙදා දීම ඩාබිඳු මැදිහත් වීම හරහා සිදු විය.

# සංවර්ධනය සංඛ්‍යා ලේඛන ගත වුවත්

පාලකයෝ සංවර්ධනයේ සංඛ්‍යා ලේඛන ගත කරති. අපි තාරුණ්‍ය කැප කරමු. ජීවත් වීමේ කර්තව්‍ය සඳහා රටක මුදුන් මල්කඩ ඔබය. මන්ද මෙය සංවර්ධන සඳහා වු පෝලිමේ පළමු වැනි අංකය හිමිවන්නේ අපට බැවිනි. උගත් දෙය පරඩැලකි. බුද්ධිය වන ගත වී ඇත. නැගණිය ඔබ හඬනවාද? සබඳ මම හඬන්නෙමි. ඔබ මෙන් මමත් ජීවත් විය යුතු නිසා. අප අසංවර්ධිතය. අපතේ යන අමුද්‍රව්‍ය, රැකියා වියුක්තිය කියා අපේ ව්‍යවසාය තත්වය වෙනුවෙන් ගොඩනැගු කර්මාන්ත කලාපයෙන් සිරුර වැහැරුණු, මනස පිරිහුනු දැත් දිගුකොට උපයාගත් කහවනු සිදී යාමට පෙර සිදිල ගියේය.

සිහින මාලිගා යදඬු, දරුණු යන්ත්‍රවල අත්ගොබ තලා යන්ත්‍ර වල ගැටී කුඩුපට්ටම් වී ගොස්ය. අප කෙසේ නොහඬන්නට වැයම් දැරුමුද උගත් දෙයින් රටට මිල දෙන්නට පාලකයෝ නොදත්තෝය. එහි ආදීනව දරුණුය. මන්ද ඔබේත් මගේත් අනාගත වලින් ඔබ්බට පවා ඒවා සිදි යන බැවිනි.

තැලීම්, පෝලීම්, සුරාකෑම් හා අයුක්තිය අසාධාරණය වැනි මිලේච්ඡ ක්‍රියාවන් අප වටකරගෙනය. අප වෙනුවෙන් කතාකරන්නට නැගී සිටින්නට අයෙක් නැත. සිටින උන් පවා දරුණු බැමි වලින් බැඳි ඇති බැවිනි. ගමෙන් නගරයට අවතීර්ණ වන ලෝකය ජීවිතය එපා කරවන්නට තරම් සමත් වී ඇත. ''සබඳ අප සංවර්ධිත යැයි, ස්වයංපෝෂිත යැයි, සමෘද්ධිමත් යැයි, තවදුරටත් සිතන්නේ කෙසේද? කඩතුරා වලින් දැස් කොටු කිරීමට වැයම් නොකරන්න. අප මලවුන් යැයි නොකියමු. මල සිරුරටත් රියන් හතරක් හිමිවන බැවිනි.එය නවාතැනේ අපට හිමිවන ප්‍රමාණයට වඩා ටිකක් අඩුවෙනි.

අපේ ශක්තිය, අපේ දහඩිය, අපේ කැපවීම වෙනුවෙන් ලියු යශෝගීත කුමක් ද? අතීතයට කටුකත්වය දුන් බුද්ධිය වියළන්නට අපේ දෙනෙත් කෙවෙනි තුළ සීතල කඳුලු බිඳු වැහැරුණු සිරුරත්, පිරිහුණු මනසත් ලඟ ඔබෙන් පමණක් අප සංවර්ධනය වුවෙමු. හෙට අලුතින් සංඛ්‍යා ලේඛන ගත වන කම්කරු සේවකයන් සඳහාත් අඩු තරමින් මෙයට වඩා දීර්ඝ කාලීන සහන වැඩපිළිවළක් සකස් කරලීමට පාලක අවධානය යොමු කර වීමට පුරෝගාමී වෙමු.

සමන්මලී

# ඔබට හිමි ඔබේ වත්කම

ඉතිරි කොටස...

- ඔබේ අරමුදලෙහි ශේෂයට සිදු කර ඇති නම් කිරීම් අවලංගු කිරීමට හා නැවත නම් කිරීමක් පිලිවෙළින් I, J අකෘති පුරවා සේව්‍යා ලවා සහතික කර ළඟම පිහිටි කම්කරු කාර්යාලයට භාර දීමට ඔබට හැකියාව ඇත.
- ඔබ සේවා ස්ථානය හැර යන්නේ නම් ඒ බව සේවය අවසන්ව දෙසතියක් තුළ E අකෘතිය සම්පූර්ණ කර ළගම පිහිටි කම්කරු කාර්යාලයට දන්වන්න.
- ඔබගේ පෞද්ගලික ගිණුම් එකතු කිරීමට අවශ්‍ය නම් G අකෘතිය සම්පූර්ණ කර ළඟම පිහිටි කම්කරු කාර්යාලයය වෙත ඉදිරිපත් කරන්න..
- ඔබ වසර 10කට වැඩි කාලයක් අරමුදලට දායක වී තිබේ නම්, ඔබගේ සේ.අ.අ. ශේෂය රුපියල් 300,000/- වැඩි නම් ඔබ දැනට අරමුදලට දායක මුදල් ගෙවන සේවා නියුක්තිකයෙන් නම් ඔබට නිවාස හෝ වෛද්‍ය හේතූන් සඳහා ඔබගේ අරමුදල් ශේෂයෙන් 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ ලබා ගත හැකි වේ. මෙම ප්‍රතිලාභ දෙවන වර ලබා ගත හැකි වන්නේ ප්‍රථම වර ලබා ගෙන වසරක් ඉක්මගිය පසුවය
- සේවක අර්ථසාදක අරමුදල් ඇපයට තබා නිවාස ණයක් පහත බැංකු වලින් ලබා ගැනීමට ඔබට හැකියාව ඇත. ඒ සඳහා ලඟම පිහිටි කම්කරු කාර්යාලයෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.
- ඔබේ අරමුදලෙහි ශේෂයට සිදු කර ඇති නම් කිරීම් අවලංගු කිරීමට හා නැවත නම් කිරීමක් සිදු කිරීමට I, J අකෘති පුරවා සේව්‍ය ලවා සහතික කර ළඟම පිහිටි කම්කරු කාර්යාලයට භාර දීමට හැකියාව ඇත.

ඉතිරි කොටස ලබන කලාපයේ
මූලාශ්‍ර : කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවෙනි

# ප්‍රහේලිකා අංක - 28

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ප | | 2 | | න | ■ | | 4 රැ |
| | ■ | ල | ■ | ■ | ■ | ■ | |
| | ■ | 5 | | | 6 න | ■ | |
| 7 | | ■ | ■ | ■ | | ■ | ■ |
| න් | ■ | ■ | ■ | 8 අ | | | ම |
| ■ | | | සි | ■ | | | ■ |
| ■ | දේ | ■ | ■ | 10 | | 11 | න |
| 12 ශා | | ■ | 13 | න | ■ | | ■ |

## හරහට

1. අනංගයාට පාර්යාය පදයකි
3. ගස්
5. තවකාලික ලැගුම් පොළ
7. නාට්‍ය ශාස්ත්‍රයෙහි නව විධි කොට දැක්වේ
8. ප්‍රතිලෝම යන්නෙහි විරුද්ධාර්ථ පදය
9. ගෞරවය පිණිස මලින් හෝ රෙදි කඩින් ඉහළින් බඳිනු ලැබේ
10. ගෙන එම හෙවත් ගෙන්වීම
12. නව ග්‍රහයන්ගෙන් කෙනෙකි
13. පොකුර හෙවත් සමූහය යන අරුත දෙන පදයකි

## පහළට

1. පංචේන්ද්‍රියයන්
2. සෙලවීම
4. දුරාතීතයේ නැව් ගමනේ දී සුළං බැඳීමට යෙදූ රෙදි කඩ
6. නන්දන වනය
9. යක්කුන්ට දෙන ලද හෙවත් පුද
10. කැලෑව ස්ථානය යන අරුත දෙන පදයකි
11. ධාන්‍ය විශේෂයකි

මෙම ප්‍රහේළිකාව නිවැරදිව පුරවා
මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.
ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.

# පබැඳුම

## සිංහ කොඩියේ සිංහයණෙනී

සිංහ කොඩියේ සිංහයණෙනී
හැත්ත එක් වසරක් පා තුනකින් සිට
නුඹ විඳිනා වදය කිම
නවගුණ වැලක් අත දැරිය යුතු යුගයක
කවුද නුඹට අසිපතක් දුන්නේ
දේශය රැක ගැනීමට අභිමානයෙන් යුතුව
නුඹ අසිපත දැරුවත්
දේශයේම ඇතැමුන් නුඹට බියේ කිම
හැත්ත එක් වසක් දේශයට නායකත්වය
දුන් දේශපාලුවන්
නුඹෙ කේසර සිඳ නමට ජාත්‍යාලයේ විෂ පොවා
කේසරයාණනි නුඹේ කණ විද
ලණුව දමා ගන්නට
නිර්ලජ්ජිතයින්ට ඉඩ නොදෙනු මැන
නුඹට පලා යාමට නොහැකිය
මන්ද?
දේශය රැකීම මිස පලායාම නිවට කමකි
කොටසකගේ සුවච කීකරු සුනඛයෙකු හෝ හිවලෙකු
නොවී නුඹ දේශය රකින මහා බලසම්පන්න
අභිමානවත් කේසරයා වනු

සුනිල් ඒ මුණසිංහ


## වෛරසය

ලොවම ලෙඩ වෙලා
ජීවිත අහිමි වෙලා
සැවොම ගෙදරට වෙලා
නගර පාලු වෙලා
සිහින බොඳ වෙලා
"කොරොනා" නුඹ
ජීවිත වලට දුන් පාඩමක් වෙලා

කුමුදුණි අබේරත්න

කම්කරු පුවත්

# සේවකයින්ට රැකියා අහිමි කළ කොරෝනා



ගෝලීය වසංගත තත්වය හමුවේ විශාල වශයෙන් බලපෑම් ඇති කළේ රැකී රක්ෂා අහිමි කිරීම් වලටයි. අසංවිධිතව සේවය කරන බහුතරයකගේ තත්වය ඊටත් වඩා බරපතල විය. මේ වන විට එදාවේල සරිකර ගැනුමට නොහැකිව ලතවෙන බොහෝ දෙනා අතර ඇඟළුම් සේවකයින් විශේෂ වේ. මාර්තු මාසයේ මැද භාගයේ සිට විවිධ දුෂ්කරතාවන් හමුවේ සිට ආර්ථිකය නංවාලීම උදෙසා රටේ පවතින ඇඳිරි නීති තත්වය හා වසංගත තත්වය පහව යාමට පෙර යළි කර්මාන්තශාලා විවෘත කිරීම සිදුවිය. ඒ සියලු සෞඛ්‍ය විධි විධාන යටතේ බව රජයේ නිගමනය විය. එහිදී සෞඛ්‍යය ප්‍රමිතීන්ට අනුව සේවකයින් කැඳවීම හා සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම විශේෂ විය.ඒ අනුව අප්‍රේල් 20 වන දින කර්මාන්තයන් ආරම්භ වීම දක්නට ලැබුණු අතර පවතින තත්වයන් යටතේ රැකියා 30%කින් කප්පාදු කිරීමට සිදුවන බව හාම්පුතුන්ගේ යෝජනාව විය. කම්කරු ගැටළු ආමන්ත්‍රණය කිරීම වෙනුවෙන් සකසාගත් කාර්යය සාධක බලකාය හමුවේ වෘත්තීය සමිති සිය විරුද්ධත්වය ප්‍රකාශ කරමින් එවැනි ක්‍රියාමාර්ග නොගන්නා ලෙසත් මාර්තු අප්‍රේල් හා මැයි මාසයන් සඳහා අදාල ගෙවීම් කරන ලෙසද බලකරන ලදි. කම්කරු ඇමතිවරයාගේ නිගමනය වූයේද රැකියා අහිමි නොකරන ලෙසයි. නමුත් අදවන විට මාස 3 සිට අවුරුද්ද දක්වා සේවා කාලය හිමි වූවන්ටද  මෑන් පවර් සේවකයින්ට මේ මොහොතේ රැකියා අහිමි කර ඇත. එසේම අවුරුදු 5 ට මාස 2ක් අඩු සේවකයින් නවක සේවකයින් ලෙස බඳවා ගැනීම මෙන්ම ස්ථිර සේවකයින් සේවයෙන් ඉවත්කොට මෑන් පවර් සේවකයින් ලෙස බඳවා ගැනීම වැනි සේවක කප්පාදු කිරීම ඉවක් බවක් නැතිව සිදුවේ. මේ රටේ ආර්ථිකයට සෘජු දායකත්වය සැපයූ පිරිසයි. මොවුන්ගේ රැකියා සුරක්ෂිත කරමින් ජාත්‍යන්තර කම්කරු නීති වල රැකවරණය මෙන්ම සමාජ සංරක්ෂණ ක්‍රම තුළින් කම්කරුවන් ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලෙස බලධාරීන්ට බලකර සිටිමු.

## වියළි ආහාර බේදා දීම





අංක: 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.